# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2497/58 - 2026 ජූලි මස 17 වැනි සිකුරාදා - 2026.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**

**අක්කරෙයිපත්තු මහා නගර සභාවේ**

**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන අක්කරෙයිපත්තු මහා නගර සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ අක්කරෙයිපත්තු මහා නගර සභාවේ අංක 05 කාදිරියා - දකුණ කොට්ඨාසයට තේරී පත්වූ උදුමා ලෙබ්බෙයි උවෙස් මහතා අයත් වන්නා වූ ජාතික කොංග්‍රසය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම අක්කරෙයිපත්තු මහා නගර සභාවේ අංක 05 කාදිරියා - දකුණ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා මුහම්මදු අබ්දුල් කාදර් අබ්දුල් හයියු මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

අක්කරෙයිපත්තු මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරී අත්තනායක මුදියන්සේලාගේ කසුන් ශ්‍රීනාත් අත්තනායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් මුහම්මදු අබ්දුල් කාදර් අබ්දුල් හයියු මහතා, අක්කරෙයිපත්තු මහා නගර සභාවේ, අංක 05 කාදිරියා - දකුණ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**කසුන් ශ්‍රීනාත් අත්තනායක,**
තේරීම්භාර නිලධාරී,
අක්කරෙයිපත්තු මහා නගර සභාව.

2026 ජූලි මස 16 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය.
අම්පාර.

EOG 07 - 0253